මූන්ගේ දේශපාලනය සහ මූන්ගේ දේශපාලනය

මේ වසරේ අප්‍රේල් මාසයේ අවසන් සති දෙකත්, මැයි මාසයේ මුල් සති දෙකත් තුළ ශ්‍රී ලංකාවේ වැඩිපුරම භාවිතා වූ වචනය "මූන්" ය. ඒ සාකච්ඡා කළේ එක්සත් ජාතීන්ගේ මහලේකම් බෑන් කී මූන් විසින් පත් කළ ත්‍රි පුද්ගල උපදේශක කමිටුව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රශ්නයට අදාල වාර්තාව නිකුත් කිරීමයි. මේ වසරේ අප්‍රේල් 12 වැනිදා මේ වාර්තාව නිකුත් වීමත් සමග මහා කලබැගෑනියක් ඇති විය. ආණ්ඩුව වාර්තාවට එරෙහිව සටන් වැදුනේ "අපි බය නෑ ඩෝ ! වරෙන් ඩෝ " වර්ගයේ චණ්ඩි දේශපාලනයකිනි. ආණ්ඩුවේ ඇමතිවරු එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාගේ උපදේශකයන් වඳුරන් ලෙස හඳුන්වා දුන්හ. "යැංකි බැංකි" ගේ දළපෙවීම් ගැන පෝස්ටර් ඇලෙවේවේ ආණ්ඩුවමය. ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිවරයෙකු වන මර්වින් සිල්වා එක්සත් ජාතීන්ට එරෙහිව මරාගෙන මැරෙන මහලොවක් හඳන බවට ප්‍රකාශ නිකුත් කළේය. වීරවංශ ඇමතිවරයා විකල්ප එක්සත් ජාතීන්ගේ සංවිධානයක් හැදිය යුතු බව කීවේය. මේ අතර ජනාධිපතිවරයා අප්‍රේල් 16 වැනිදා ආරලියගහ මන්දිරයේ පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංවිධායක හමුවකදී පැවසුවේ අධිරාජ්‍යවාදීන් තමා විදුලි පුටුවට යැවීමට උත්සහ කරන බවය. ඉන් අනතුරුව ජනාධිපතිවරයා විදුලි පුටුවෙන් බේරා ගැනීම සඳහා පෙත්සම් අත්සන් කිරීමේ ව්‍යාපාරයක්ද ඇරඹිනි.

නමුත් දැන් ඒ ගායනයේ තනුව වෙනස් වී ඇත. චන්ඩි පාටි අවසන් වී ආණ්ඩුව එක්සත් ජාතීන්ගේ ගුණ ගායනා කරමින් සිටී. මැයි මස 4 වැනිදා විදේශ කටයුතු අමාත්‍යංශය නිකුත් කළ නිවේදනයක සඳහන්ව තිබුනේ "ශ්‍රී ලංකාව තව දුරටත් එක්සත් ජාතීන් සමග එක්ව කටයුතු කරන අතර මේ වාර්තාව එක්සත් ජාතීන්ගේ වාර්තාවක් ලෙස ලොව පිළි නොගන්නා" බවය. මැයි 5 වැනිදා ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරු දෙදෙනෙක් විශේෂ පුවත්පත් සාකච්ඡාවක් කැඳවා වෙනත් ම ආකාරයේ පැහැදිලි කිරීමක් සිදු කළහ. එහිදී නිමල් සිරිපාලඳ සිල්වා ඇමතිවරයා මෙසේ ප්‍රකාශ කළේය. "එක්සත් ජාතීන්ගේ සංවිධානය කියන්නේ අපේ සංවිධානය. ඒ නිසා එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා කියන්නේ අපේ මහ ලේකම්." එම මාධ්‍ය හමුවේදී මෛත්‍රීපාල සිරිසේන ඇමතිවරයා මෙසේ ප්‍රකාශ කළේය. "එක්සත් ජාතීන්ගේ සංවිධානයට එරෙහිව අපේ රජය කිසිම දෙයක් කරන්න බලාපොරොත්තු වෙන්නෙත් නෑ. කරන්නෙත් නෑ. අපට එහෙම කරන්නත් බෑ. ඒ වාර්තාවේ ඇති කරුණුවලට නිසි අවස්ථාවේදී, නිසි පරිදි පිළිතුරු සපයනවා." මෙසේ කියන්නේ බෑන් කී මූන් ට "මංකි මූන් " කියා අවමන් කළ, ඔහු ගම ගාවින්නට කෑ ගැසූ ආණ්ඩුවටය. මේ ආකාරයට ආණ්ඩුවේ බෙර පදයේ රිද්මය වෙනස් වීම පසුපස ඇති හේතුව වටහා ගත යුතුය. මේ වාර්තාව පදනම් කරගෙන ආණ්ඩුව මහා දේශප්‍රේමී මෙහෙයුමක් දියත්කර රටතුළදී දේශපාලන වාසි ලබාගැනීමට දැරූ උත්සහය හකුලාගෙන ඇත. ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු දෙකක් බලපා ඇති බව පෙනේ.

1.මෙවැනි වාර්තාවක් එළි දැක්වීම සඳහා ආණ්ඩුවද වගකිවයුතු බව ජනතාව වටහා ගැනීම නිසා ව්‍යපෘතිය අසාර්ථක වීම.

2.ආර්ථික ක්ෂේත්‍රයේදී පමණක් නොව දේශපාලන ක්ෂේත්‍රයේදී සිය අවන්ත භාවය පෙන්වන ලෙස අධිරාජ්‍යවාදීන් කළ බලපෑමට යටත් වීම.

මේ වාර්තාව තුළ අධිරාජ්‍යවාදීන්ගේ අරමුණු සහ ඒ කෙරෙහි වන ආණ්ඩුවේ වගකීම වටහා ගැනීම ඉතා වැදගත්ය. පළමුකොටම කිවයුත්තේ මෙවැනි වාර්තාවක් එළි දැක්වීම තුළ අධිරාජ්‍යවාදීන්ගේ අරමුණ වී ඇත්තේ ශ්‍රී ලංකාවේ ජනතාවට යුක්තිය ඉටුකිරීම පෙන්වන බවය. යුද්ධය නිසා විවිධාකාරයෙන් පීඩාවට පත් ශ්‍රී ලාංකිකයන්ට යුක්තිය ඉටුකිරීමේ අභිප්‍රායක් එක්සත් ජාතීන්ගේ සංවිධානයට නැත. ඔවුන් පලස්තීන ජනතාව යුක්තිය ඉටුකිරීමට මැදිහත් වන්නේ නැත. නේටෝ ගුවන් ප්‍රහාර වලින් පාකිස්තානයේ ස්ටැට් හිමිනයේ සිවිල් ජනතා මිය යාම කට අරින්නේවත් නැත. එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්මාණය කර ඇත්තේ ලෝක ජනතාවට යුක්තිය ඉටු කිරීම සඳහා නොවේ. අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රය ලොව සෑම රටකම ක්‍රියාත්මක කිරීම සඳහාය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්ද ඔවුන්ගේ මැදිහත් වීම ලාංකීය ජනතාවගේ අයිතීන් වෙනුවෙන් සිදු කරන මැදිහත්වීමත් නොවේ. ලංකාවේ පාලකයන් " බිලැක්මේල් " කර නව යටත් විජිතවාදී න්‍යාය පත්‍රය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වන මැදිහත් වීමකි.

නමුත් මේ මැදිහත්වීමට එරෙහි පාර්ශවයේ නායකත්වය ගැනීමට ආරක්ෂාවට කිසිදු අයිතියක් නැත. මෙවැන මැදිහත්මක් හා අත පෙවීමක් සඳහා පාර කපුවේ ආණ්ඩුවේ පටු"බලලෝහි හා දෙබිඩි දේශපාලන පිළිගනියි. ඒ බව මෙම වාර්තාව පිළිබඳ ඉතිහාසය හැදෑරීමෙන් සොයාගත හැක. එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා උපදේශක කමිටුවක් පිහිටුවීම පිළිබඳ ඉතිහාසය යුද්ධයේ අවසන් මොහොත දක්වාම දිවයයි.

2009 මැයි 18 වැනිදා යුද්ධයේ අවසානය නිවේදනය වීමත් සමග එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා ශ්‍රී ලංකාවට පැමිණියේය. ඉන් පසුව ඔහු හා ලංකාවේ ආණ්ඩුව අතර මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදයට අදාල එකඟතාවයක් ඇතිවිය. එම සාකච්ඡාවලින් පසුව 2009 මැයි 23 වැනිදා බෑන්කී මූන් හා මහින්ද රාජපක්ෂ යන දෙදෙනාම අත්සන් කළ ඒකාබද්ධ නිවේදනයක් මාධ්‍ය වෙත නිකුත් කෙරිනි. එම ඒකාබද්ධ නිවේදනයේ අවසන් ඡේදයේ මෙසේ සඳහන් වේ.

"ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට හා ශ්‍රී ලංකාවේ අත්‍යන්තර ගිනි අනුව යමින් රටතුළ මානව හිමිකම් වර්ධනය කිරීමට හා ආරක්ෂා කිරීමට, ශ්‍රී ලංකාව සිය තදබල කැපවීම යළිත් ප්‍රකාශ කර සිටී. ජාත්‍යන්තර මානුෂීය හා මානව හිමිකම් ගිනි උල්ලංගනය වීම පිළිබඳ වගකීමේ ක්‍රියාදාමයක් ස්ථාපිත කිරීමේ වැදගත්කම මහලේකම්වරයා විසින් පෙන්වා දෙන ලදී. එවැනි දුක්ගැනවිලි පිළිබඳ ශ්‍රී ලංකා ආණ්ඩුව පියවර ගනු ඇත."

ඒ අනුව මානව හිමිකම් පිළිබඳ වගකීමේ ක්‍රියාදාමයක් ස්ථාපිත කිරීමට පොරොන්දු වී ඇත. එමෙන්ම ජාත්‍යන්තර මානව හිමිකම් ගිනි හා ශ්‍රී ලංකාවේ ගීතය නුරු කිරීමට පොරොන්දු වී ඇත. නමුත් ආණ්ඩුව ඉන්පසු එලැඹි වසර තුළ මේ සියල්ල අමු අමුවේ උල්ලංගනය කළේය. දරුස්මාන්ගේ නායකත්වයෙන් යුතු උපදේශක කමිටුවක් පිහිටුවීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉඩ සැළසුනේ ඒ ආකාරයය.

ආණ්ඩුවට තවදුරටත් "රෑ දැනියෙල් " දවල් මිගෙල්"
දෙබිඩි චරිතය රඟපෑම අපහසු වී තිබේ.

යුද්ධයෙන් පීඩාවට පත් ජනතාවට සාධාරණය ඉටු කිරීම සඳහා ආණ්ඩුව පවර ගත්තේ නැත. අවතැන් වූ ජනතාවගේ මූලික අයිතිවාදිකම් පවා ස්ථාපිත කෙරුනේ නැත. නැවත පදිංචි කිරීම ඉතා අවිධිමත් ආකාරයෙන් සිදු වූ අතර, නැවත පදිංචි කළ ජනතාවගේ ජීවිත සුරක්ෂිත භාවය පිළිබඳ සහතිකයක් තිබුනේ නැත. යුද්ධය තිබාවී වසර දෙකක් ගත වුවත් තවමත් අත්ඝඩංගුවේ සිටින අයගේ නාමලේඛනයක් ප්‍රසිද්ධ කර නැත. අතුරුදහන් වූවන් ජීවත්ව සිටිද, මියගොස් ඇත්ද යන්න නිශ්චය කර නැත. මිය ගිය අයට වන්දි ගෙවීම පසසකින් තැබුවත් මරණ සහතික පවා නිකුත් කර නැත. නඩු පවරා ඇති අයගේ ගෛතික ක්‍රියාදාමයන් ඇදෑහිය නොහැකි තරම් සෙමින් සිදුවන අතර එය වේගවත් කිරීමට වැඩපිළිවෙලක් නැත. උතුරේ හැඟෙනතිර ජනතාවගේ ඉඩම් ඇතුළු දේපල කොල්ලකෑම සිදුවන අතර ඔවුන්ගේ සංස්කෘතික අයිතීන් බරපතල ලෙස උල්ලංගනය වෙමින් තිබේ. යුද්ධය නිමා වූ පසු ආණ්ඩුව මෙම ප්‍රශ්න විසඳීමට ප්‍රමුඛත්වය දිය යුතුව තිබිනි. ඒකාබද්ධ ප්‍රකාශයේ සඳහන් වන ආකාරයට වගවීමේ කොමිෂමක් ස්ථාපිත කර දුක්ගැනවිලි පිළිබඳව පියවර ගතයුතුව තිබිනි.

නමුත් ආණ්ඩුව කළේ යුද්ධයෙන් පසුව පැන නැගුනු සමාජ මනෝභාවයන් භාවිතා කර සිය බලය ශක්තිමත් කර ගැනීමට කටයුතු කිරීමයි. ඒ සඳහා දිගින් දිගටම එක දිගට මැතිවරණ පැවැත්වූ අතර, වීරදැඩි පාසිකයන් දුර්වල කිරීම සඳහා මර්ධනය දියත් කෙරිනි. එහි ප්‍රතිඵලය වූයේ යුද්ධය පැවති කාලයටත් වඩා යුද්ධයෙන් පසුව ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් උල්ලංගනය වීමයි. මාධ්‍ය වෙත දැවැන්ත වර්ධනයක් දියත් විය. යුද්ධය නිමා වූ පසු 2009 අගෝස්තු 27 වැනිදා ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් විය. 2010 ජනවාරි 31 වැනිදා ලංකා පුවත්පත සිල් තබා එහි කර්තෘවරයා අත්අඩංගුවට ගත්තේය. 2010 ජූනි 30 වැනිදා සියත රූපවාහිනී ආයතනයටත්, 2011 ජනවාරි 31 වැනිදා ලංකා ඊ නිව්ස් කාර්යාලයටත් ගිනි තබන ලදී. මාධ්‍යවලට පමණක් නොව සිය අයිතීන් හේතුවෙන් කටයුතු කරන බලවේග වෙතද මර්ධනය එල්ල විය. සාධාරණ වැටුප් වැඩි වීමක් ඉල්ලා 2011 මාර්තු 16 දින එක්දින සංකේත වැඩ වර්ජනයක නියුතු විශ්වවිද්‍යාල ආචාර්වරුන්ගේ දිනක වැටුප කපා හරින ලදී. ස්වේච්ඡා තනතුරුවලින් ඉල්ලා අස්වන ආචාර්වරුන්ගේ වැටුප් කපා දැමීමට 2011 මැයි 20 දින චක්‍රලේඛයක්ද නිකුත් කර ඇත. මේ අනුව කාලයක් තිස්සේ පිළිගත් කම්කරු අයිතීන් පවා උල්ලංගනය කිරීමට ආණ්ඩුව පෙළඹී ඇත. සිය අයතීන් වෙනුවෙන් සටන් කිරීම නිසා ශිෂ්‍යාවන්ද මර්ධනයට ගොදුරු විය. විශාල පිරිසිකගේ ශිෂ්‍යභාවය අහෝසි කළ අතර එය කරනු ලැබුවේ කිසිදු විචාරයකින් තොරවය. ඇතැම්විට මියගිය අයගේ පවා ශිෂ්‍යභාවය අහෝසි කර තිබිනි. පසුගිය මැයි 13 වැනිදා පනාගොඩ යුධ හමුදා කඳවුරේදී උසස් අධ්‍යාපන ඇමති එස්. බී. දිසානායක කළ කතාව මේ මර්ධනය පිළිබඳ කදිම නිදසුනකි.

"1988 ඉඳලා මම උසස් අධ්‍යාපන ඇමතිතුමා වෙනකන්ම විශ්වවිද්‍යාල පාලනය කළේ ශිෂ්‍යාවන්. ඒ නිසා විශ්වවිද්‍යාලවල මරිටක කඩාගෙන වැටුනා. අධ්‍යාපන මරිටක කඩාගෙන වැටුනා. මම ඇමති උනාට පස්සේ සීයයි, දෙසීයයි, එකසිය පනහයි, තුන්සීයයි, තොග පිටින් රැලියට දැම්මා. පස්සෙ බලනකොට ජයවර්ධනපුර බැරේච්ච එකෙකුත් එලියට දලා." ආණ්ඩුව සිය බල උවමනාවන් වෙනුවෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කළේ ඒ ආකාරයටය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ ලංකාවේ අතපෙවීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඒ හරහා පාරක් කපාගැනීමට හැකිවීමය.

2009 මැයි 23 වැනිදා ඒකාබද්ධ නිවේදනයෙන් පොරොන්දු වූ ආකාරයට ආණ්ඩුව කටයුතු නොකරන නිසා, තමන්ට මේ පිළිබඳ උපදෙස් දීමට කමිටුවක් පත්කළ යුතුව ඇතැයි බෑන් කී මූන් 2010 මාර්තු 5 වැනිදා ලංකාවේ ජනාධිපතිවරයාට දුරකථනයෙන් දැනුම් දී ඇත. එහිදී ජනාධිපතිවරයා ඊට එකඟ වූ බව එක්සත් ජාතීන්ගේ සංවිධානය පවසයි. ඒ අනුව මෙම උපදේශක කමිටුව පත්කර ඇත්තේ ලංකාවේ ආණ්ඩුවේ අනුමැතියද ඇතිවය. කෙසේ වෙතත් සේ දුරකථන ඇමතුමෙන් පසුව හෝ මාස 3ක් ගෙවෙන තුරුත් වගවීමේ ක්‍රියාදාමයක් ස්ථාපිත කිරීමට ආණ්ඩුව කටයුතු කළේ නැත. කමිටුවක් පත්කිරීම වැළැක්වීමට කිසිදු රාජතාන්ත්‍රික පියවරක් ගත්තේද නැත. 2010 ජූනි 20 වැනිදා එක්සත් ජාතීන්ගේ මහලේකම් වරයා උපදේශක කමිටුවක් පත් කරන බව ප්‍රකාශ කළ අවස්ථාවේදීවත් ආණ්ඩුව ඉක්මන් මැදිහත් වීමක් කලේ නැත. අවසානයේදී 2010 ජූනි 24 වැනිදා උපදේශක කමිටුව පත්කරන ලදී. කමිටුව පත්කිරීමෙන් අනතුරුව ආණ්ඩුව පාර්ශවයෙන් කළයුතු රාජතාන්ත්‍රික මැදිහත්වීම් ගණනාවක් තිබිණි. ඒ කිසිවක් නොකළ ආණ්ඩුව 2010 ජූලි 6 වැනිදා එක්සත් ජාතීන්ගේ කොළඹ කාර්යාලය දඉරිපිට ටැර් පුවස්සමින්, තොවිල් කරමින්, සේවකයන් ප්‍රාණ අපපයට ගනිමින් යකා ගැටුවේය. ආණ්ඩුවේ ඇමතිවරයෙකු උපවාසයකට වාඩි විය. එහෙත් රාජතාන්ත්‍රික පියවරක් ගත්තේ නැත. උපදේශක කමිටුව ආණ්ඩුව පාර්ශවයෙන් මත පල කළේද නැත. මේ සියල්ලේ ප්‍රතිඵලයක් ලෙස එම කමිටුව ආණ්ඩුවට ඉතා අවාසිදායක වාර්තාවක් නිකුත් කර තිබේ.

මේ කමිටු වාර්තාව පිළිබඳ " මූන්ගේ දේශපාලනයේ " ආධිපත්‍යවාදී හා ආක්‍රමණකාරී අරමුණ තිබෙන අතරම "මූන්ගේ (ආණ්ඩුවේ) දේශපාලනයේ "මෝඩ කම් හා අමතකමද තිබෙන බව ජනතාව පවසන්නට ගත්තේ ඒ නිසාය. මූන්ට එරෙහි දේශප්‍රේමී ව්‍යාපෘතිය නොඩහැගීමේ ආණ්ඩුවේ අරමුණ ව්‍යර්ථ වූයේ "මූනුත් එකයි මූන් එකයි" කියා ජනතාව කියන්නට පටන් ගැනීම නිසාය. ඒ නිසා දැන් ආණ්ඩුවට එක්සත් ජාතීන්ගේ සංවිධානයට බැන වැදීම පසෙක තබා, එහි ගුණ ගායනා කිරීමට සිදුව තිබේ.

දෙවන කරුණ වන්නේ අධිරාජ්‍යවාධී රටවල් විසින් එල්ල කරනු ලබන පීඩනයයි. ආණ්ඩුව මුලින් උත්සහ කළේ අධිරාජ්‍යවාදීන්ගේ ආර්ථික න්‍යායපත්‍රය ක්‍රියාත්මක කරන අතර දේපාලනයේදී අධිරාජ්‍ය විරෝධයක් මවා පෑමටය. පහුගිය අයවැය ලේඛනය සම්පූර්ණයෙන්ම පාහේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සතුටු කිරීම සඳහා සකස් කළ ලේඛනයකි. ආණ්ඩුව තමන් කියන ආකාරයටම නව ලිබරල්වාදය ක්‍රියාවට ගනන නිසා ලංකාවට දෙන ණය ප්‍රමාණය දෙගුණ කරන බවට ලෝක බැංකුවද ප්‍රකාශ කර තිබිනි. මේ ආකාරයට අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතන වල පදයට නටන විට මතුවන ජනතා විරෝධය මැඩලීමට භාවිතා කළේ දේශ ප්‍රේමයෙයි. අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි ජනතා සුඛසාධන කපා දැමීමට එරෙහිව, බදු බර පැනවීමට එරෙහිව, වැටුප් වැඩි නොකිරීමට එරෙහිව, ආදී වශයෙන් පැන නැගුනු අරගල ආණ්ඩුව මර්ධනය කළේ අධිරාජ්‍යවාදයේ ඉන්තන් ගැනි ලේඛලයක්ද දැල්වමිනි. නමුත් දැන් ආර්ථිකයේදී අධිරාජ්‍ය හැකි වන අතර දේශපාලනයේදී බොරු අධිරාජ්‍ය විරෝධයක් භාවිතා කිරීමේ දෙබිඩි දේශපාලනයට හැවතීමේ නිත වැටී තිබේ. ආර්ථික ක්ෂේත්‍රයේදී පමණක් නොව දේශපාලන ක්ෂේත්‍රයේදී ද තමන්ගේ ව්‍යාපෘතිය ඉදිරියේ දන ගසන්නැයි අධිරාජ්‍යවාදීන් ආරක්ෂාවට නියෝජනය කරයි.

මේ පිළිබඳ හොඳම උදාහරණය වන්නේ පසුගිය මැය 4 වැනිදා කොළඹදී පැවැත් වූ මාධ්‍ය හමුවකදී ඇමරිකා එක්සත් ජනපදයේ දකුණු ආසියාව බාර නියෝජ්‍ය රාජ්‍ය ලේකම් රොබට් ඕ බ්ලේක් පැවසූ කතාවය. බ්ලේක් එහිදී මෙසේ ප්‍රකාශ කළේය. " ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මානුෂීය නීති උල්ලංගනය ගැන වගකීමට දේශීය යාන්ත්‍රනයක් යොදාගත යුතුය. වනවිමට එවැනි දේශීය යාන්ත්‍රණයක් අපොහොසත් වන්නේනම් පමණක් ජාත්‍යන්තර යාන්ත්‍රණයක් පැමිණිය යුතුයි. "ඇමරිනා එක්සත් ජනපදය මේ කියන්නේ අන් කිසිවක් නොව 2009 මැයි 23 වැනිදා එළඹුනු එකඟතාව ක්‍රියාත්මක කරන ලෙසය. එය ක්‍රියාත්මක නොකර, ආර්ථික ක්ෂේත්‍රයේ යටහත්භාවය පමණක් පිළිගැනීමට ඔවුන් සූදානම් නැති බවය. ඒ නිසා දැන් ආණ්ඩුව සිය බොරු දේශප්‍රේමය පසෙකින් තබා සිය සැබෑ අධිරාජ්‍ය ගැති මුහුණුවර පෙන්වීමට සිදුව තිබේ. නිමල් සිරිපාලද සිල්වා මෛත්‍රීපාල සිරිසේන විශේෂ මාධ්‍ය හමුවක් පැවැත්වීමේ පසුපස ඇති සැබෑ හේතු වන්නේ ඒවායි.

කෙසේ වෙතත් එකක් පැහැදිලිය. ආණ්ඩුවට තවදුරටත් "රෑ දැනියෙල් " දවල් මිගෙල්" දෙබිඩි චරිතය රඟපෑම අපහසු වී තිබේ. ඉංග්‍රීසි භාෂාවෙන් අත නගන අතර සිංහල භාෂාවෙන් චන්ඩි පාටි දැමීමේ දේශපාලනය තවදුරටත් වලංගු නැත. ආර්ථික ක්ෂේත්‍රයේදී උපරිම අධිරාජ්‍ය නැති වන අතර, දේශපාලන ක්ෂේත්‍රයේදී ව්‍යාප් අධිරාජ්‍ය විරෝධයක් මවා පෑමේ උපතුමයද අසාර්ථකය. ඒ නිසා දැන් විවර වී ඇත්තේ වෙනත් තත්වයකි. ඒ නව තත්වය සඳහා අවශ්‍ය ප්‍රඥාව හා ධෛර්යය සමාජ ගත කිරීම, මේ මොහොතේ සියළු ප්‍රගතිශීලීන්ගේ හා සැබෑ දේශප්‍රේමීන්ගේ වගකීමකි.

ජනතා විමුක්ති පෙරමුණ

ජාත්‍යන්තර අංශය - ඕස්ට්‍රේලියානු කමිටුව